**මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ එහි පරිපාලිතය - 2022**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි ("සමාගම") සහ සමාගමේ සහ එහි පරිපාලිතයේ ("සමූහය") "හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දින තෙක් ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිගු කාලීන ලැබිය යුතු හිඟ ශේෂ එකතුව රු.56,554,386 ක් වර්ෂ 1 සිට වර්ෂ 5 කට වැඩි කාලසීමාවක් දක්වා හිඟව පවතී. | **පින්ගාරා ටවුන් ඇන්ඩ් කන්ට්‍රි ක්ලබ්**<br><br>නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒවා විභාග අදියරේ පවතී.හිඟ කාලසීමාව සැලකිල්ලට ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ ප්‍රතිපාදන සිදු කර ඇත.<br><br>**දේපල වෙළඳාම ලැබිය යුතු අත්තිකාරම් - අම්පිටිය**<br><br>2023 වර්ෂයේදී රු. 238,200 ක් දැනටමත් අයකරගෙන ඇත. ශේෂය රු.402,513 ක් 2023 අවසානය වන විට එකතුකර ගැනීමට කටයුතු සූදානම් කර ඇත.<br><br>**සේවක ලැබිය යුතු ගිණුම**<br><br>*කඳාන වංචාව-රු.37,160,419.48<br>මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ සේවකයාට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. නඩුව විභාග අදියරේ පවතී.<br><br>හිඟ කාලසීමාව සැලකිල්ලට ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 37.16 ක සම්පූර්ණ ප්‍රතිපාදන සිදු කර ඇත.<br><br>*භාග්‍ය මහතාගෙන් ලැබිය යුතු (හලාවත ශාඛාව) රු. 235,580.96<br><br>හිඟ ශේෂය අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඊට අමතරව, ශේෂය අයකරගැනීමට 2023 වර්ෂයේදී සම්පූර්ණ ප්‍රතිපාදන සිදු කෙරේ.<br><br>*අනුරාධපුර උකස් වංචාව– **රු.** 4,995,491.87<br><br>හිඟ මුදල් අයකර ගැනීමේ වංචාව සිදුකල සේවකයාට | දීර්ඝ කාලීන ලැබිය යුතු හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතු බව නිර්දේශ කෙරේ. |

එරෙහිව අනුරාධපුර දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

මේ අතර, සමාගම සතුව පවතින රන් භාණ්ඩවල වෙළඳපල වටිනාකම හා ලැබුණු රක්ෂණ අගය සලකා බැලීමෙන් පසුව රු.2,879,488 ක ප්‍රතිපාදන සිදුකර ඇත.

ගාල්ල ශාඛාව

හිටපු ශාඛා කළමනාකරු- නිලංග මහතාගෙන් ලැබිය යුතු රු. 296,000

මුදල අයකර ගැනීමට සාකච්ඡා පවත්වනු ලැබේ.ඊට අමතරව, මුදල හා කාල සීමාව සලකා නීතිමය උපදෙස් ගනු ලැබේ.

ණය නිරවුල් කිරීම- එකෝ කබානා රු. 2,673,905.65

ගාල්ල එස්සිඅයිබී හි නඩුවක් ගොනු කර ඇත. නඩුව අවසාන අදියරේ පවතී.

රු. 839,950.94

වෙනස සඳහා සම්පූර්ණයෙන් ප්‍රතිපාදන සිදු කර ඇති අතර අභ්‍යන්තර විගණන අංශයේ නිර්දේශයෙන් පසු ඉවත් කරනු ඇත.

වෙන්නප්පුව ශාඛාව රු.1,347,300

මෙම නඩුව ඉවත් කර ඇති අතර වාහනය විකුණා ඇත.ශේෂය සමාගමේ ප්‍රතිපත්තිය අනුව ලියාහරිනු ඇත.

මාතර ශාඛාව- (රු.15,000)

2023 දී දැනටමත් නිරවුල් කර ඇත.

## 1.5.2 ගෙවිය යුතු මුදල්

**විගණන නිරීක්ෂණය**

(අ) හඳුනා නොගත් සෘජු තැන්පතු, ඉදිරිපත් නොවූ ගෙවීම්, පාරිභෝගික එකතු කිරීමේ ගිණුම් සහ වැටුප් පාලන ගිණුම්වල වසර 1 සිට වසර 5 ට වැඩි කාලසීමාවක් සඳහා එකතුව රුපියල් 154,783,481 ක දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ නිරීක්ෂණය විය. එම දීර්ඝ කාලීන හිඟ ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත.

**හිඟ කාලසීමාව (වර්ෂ)**

| **විස්තරය** | **0-1 (රු. මිලියන)** | **1-3 (රු. මිලියන)** | **3-5 (රු. මිලියන)** | **වර්ෂ 5 ට වැඩි (රු. මිලියන)** | **එකතුව (රු. මිලියන)** |
|---|---|---|---|---|---|
| හඳුනා නොගත් සෘජු තැන්පතු | 2.83 | 4.53 | 5.15 | 6.38 | 18.89 |
| ඉදිරිපත් නොවූ ගෙවීම් | 0.54 | 1.37 | 0.49 | 1.67 | 4.07 |
| පාරිභෝගික එකතු කිරීමේ ගිණුම් | 5.48 | 1.30 | 0.53 | 100.03 | 107.34 |
| වැටුප් පාලන ගිණුම් | 23.62 | 0.63 | 0.19 | 0.04 | 24.48 |
| **එකතුව** | **32.48** | **7.83** | **6.36** | **108.12** | **154.78** |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

**හඳුනා නොගත් සෘජු තැන්පතු**

අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. මේවා විමර්ශන ක්ෂේත්‍රයේ කිසිදු හඳුනාගැනීමකින් තොරව ගණුදෙනුකරුවන් විසින් කරන ලද සෘජු තැන්පතු වේ. මණ්ඩලයේ අනුමත දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කිරීමේ ප්‍රතිපත්තියට අනුව දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

මීට අමතරව, සාධාරණීකරණයක් සහිතව කෙටි කාලසීමාවක් සමග ඕනෑම දිගුකාලීන හිඟ ශේෂයන් ඉවත් කිරීමට ප්‍රතිපත්තිය සංශෝධනය කෙරේ.

**ඉදිරිපත් නොවූ ගෙවීම්**

මූල්‍ය අංශය විසින් ඉවත් කිරීම සඳහා අදාල අංශ සමග පසු විපරම් සිදු කරයි. ඉතිරි ඕනෑම ශේෂයක් මාස 06 කට පසු දෙන ලද පොදු ලෙජර ගිණුමකට මාරු කෙරේ.

මණ්ඩලයේ අනුමත දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කිරීමේ ප්‍රතිපත්තිය අනුව දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කෙරේ.

**පාරිභෝගික එකතු කිරීමේ ගිණුම්**

ශේෂය අතරින් රු. මිලියන 100, එම්එස්බී හි ආයෝජනයක් සඳහා නවාරා කැපිටල් වෙතින් ලද අත්තිකාරම් අරමුදල්වලට අදාල වේ. කොන්දේසි කඩ කිරීම හේතුවෙන් එකඟ වූ ආයෝජනය සිදු නොවීය. ඉන් අනතුරුව නවාරා කැපිටල් විසින් ගෙවන ලද අත්තිකාරම ආපසු ලබාදීම සඳහා නිතිමය ක්‍රියාමාර්ග ගොනු කර

**නිර්දේශය**

දීර්ඝ කාලීන හිඟව පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හා සමාගමේ නියෝග සහ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු බව නිර්දේශ කෙරේ.

| | | | |
|---|---|---|---|
| | | ඇත. අදාල නඩුව අවසාන අදියරේ පවතී. නඩුව අවසන් වන තුරු ශේෂය පවත්වා ගත යුතුය. මෙම මුදල පාරිභෝගික එකතුවක් නොවන බැවින් ශේෂය සුළු ණයහිමි ගිණුමකට මාරු කරනු ලැබේ.<br><br>පාරිභෝගික එකතුකිරීම් නිරවුල් කිරීමට අදාල වන වෙනත් ශේෂයන් කොන්ත්‍රාත් නිරවුල් කිරීමත් සමග ඉවත් වේ.<br><br>දිගු කාලයක් හිඟව පවතින ඕනෑම ශේෂයක් සමාගමේ ප්‍රතිපත්තිය අනුව ඉවත් කෙරේ.<br><br>**වැටුප් පාලන ගිණුම**<br><br>අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. 2017 සිට 2020 දක්වා ශේෂ දැනටමත් ඉවත් කර ඇත. අනෙකුත් දිගු කාලින හිඟ ශේෂයන් ඉවත් කෙරෙමින් පවතී. | |
| **(ආ)** | 2022 දෙසැම්බර් 31 වන දිනට මඩම්පැල්ල දේපල වෙළඳාම සහ මාරවිල දේපල වෙළඳාම යන 2 ම සම්පූර්ණයෙන් විකුණා අවසන් වුවද , මඩම්පැල්ල දේපල වෙළඳාම සහ මාරවිල දේපල වෙළඳාම සඳහා කර තිබූ ප්‍රතිපාදන වන පිළිවෙලින් රු.1,099,770 හා රු.1,789,893 ක මුදල 2022 දෙසැම්බර් 31 දිනට රු.27,453,987 ක් (පොදු ලෙජර අංක.20108) වන මුළු උපචිත වියදම් මුදලෙහි ඇතුලත් වේ.(මෙම ප්‍රතිපාදන 2 ම 2021 වර්ෂයේදී සිදු කර ඇත. | **මඩම්පැල්ල**<br><br>රු. 1,099,770 ක ශේෂය මූල්‍ය ප්‍රකාශන වලින් දැනටමත් ඉවත් කර ඇත.<br><br>**මාරවිල**<br><br>අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. ඉතිරි රු.1,789,893 2023.11.10 වන විට ආපසු හැරවෙනු ඇත. | ඉඩම් සම්පූර්ණයෙන් විකුණා ඇති බැවින් මෙම ගිණුම් ශේෂ ඉවත් කිරීමට නිර්දේශ කෙරේ. |

### 1.5.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 වන දිනට ප්‍රධාන අක්‍රිය ගණුදෙනුකරුවන් 10 දෙනාගේ ප්‍රාග්ධන හා පොළී හිඟ ශේෂය රු. මිලියන 1,241.46 ක් විය. | **1.ඒ පී ඒ ජුවලරි (පුද්) සමාගම**<br><br>රු. මිලියන 60 ක් 2023 දී දැනටමත් එකතු කරගෙන ඇත.පහසුකම සම්පූර්ණයෙන් නිරවුල් කිරීම සඳහා සාකච්ඡා සිදු වෙමින් පවතී. | ගණුදෙනුකරුවන්ගෙන් හිඟ මුළු මුදල අයකර ගැනීමට සමාගම විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය බව නිර්දේශ කෙරේ. |

| | ණයගැනුම්කරුගේ නම | ප්‍රාග්ධන හිඟ මුදල (රු. මිලියන) | පොළී හිඟ මුදල (රු. මිලියන) | එකතුව (රු. මිලියන) |
|---|---|---|---|---|
| 1 | ඒ පී ඒ ජුවලරි (පුද්) සමාගම | 193.98 | 68.12 | 262.10 |
| 2 | මැග් ස්ටෝරේජ් බැටරි (පුද්) සමාගම | 139.76 | 183.62 | 323.38 |
| 3 | වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම | 79.75 | 28.74 | 108.49 |
| 4 | සදර්න් ගෘප් සිවිල් ඉංජිනියරින් (පුද්) සමාගම | 79.24 | 7.65 | 86.89 |
| 5 | දයා ගෘප් (පුද්) සමාගම | 78.02 | 47.08 | 125.10 |
| 6 | ඔරු මික්ස් ඇෂෝල්ට් (පුද්) සමාගම | 56.82 | 69.55 | 126.37 |
| 7 | වැව්ලි සංවර්ධන සහ කළමණාකරන (පුද්) සමාගම | 52.12 | 23.75 | 75.87 |
| 8 | ආචාර්ය යූ.ජී.එෆ්.ප්‍රනාන්දු | 38.64 | 6.96 | 45.60 |
| 9 | සීගිරිය වයිස්රෝයි හොටෙල් (පුද්) සමාගම | 33.84 | 23.82 | 57.66 |
| 10 | අනුර මැන් පවර් සප්ලයර්ස් (පුද්) සමාගම | 30.00 | 0.00 | 30.0 |
| **එකතුව** | | **782.17** | **459.29** | **1,241.46** |

නව ආයෝජකයෙකු ව්‍යාපාරය තක්සේරු කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. ආයෝජකයා සමග නිරවුල් කිරීමේ සාකච්ඡා සිදු වෙමින් පවතී.

***2.* මැග් ස්ටෝරේජ් බැටරි (පුද්) සමාගම**

නීතිමය ක්‍රියාමාර්ග විභාග අදියරේ පවතී. නිරවුල් කිරීම සඳහා නිරවුල් කිරීමේ සාකච්ඡා කෙරෙමින් පවතින අතර නිරවුල් කිරීමේ යෝජනා අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර අවසන් එකඟතාවයකට පැමිණ නැත.

***3.* වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම**

අවසන් කිරීම සම්බන්ධයෙන් අපගේ පාරිභෝගිකයාට එරෙහිව නඩු පවරා ඇත. ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව ප්‍රොක්සි ගොනු කර අවසන් කිරීමේ ඉල්ලීමට සහායවීම සඳහා නඩුවට මැදිහත් විය. අයදුම්පත ප්‍රතික්ෂේප කරමින් 2022/02/24 දිනැති අවසන් කිරීමේ නියෝගය භාරදෙන ලදී. උකස් කර ඇති දේපල බැහැර කිරීමෙන් නිරවුල් කිරීම අපේක්ෂා කෙරේ.

***4.* සදර්න් ගෘප් සිවිල් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම**

පහසුකම 2023 දී සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත.

***5.* දයා ගෘප් (පුද්) සමාගම**

නීතිමය කටයුතු ආරම්භ කර ඇත. වත්මන් ලිපිනයෙහි නොමැති නිසා සිතාසි භාරදිය නොහැක.

මේ අතර නිරවුල් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

***6.*** **ඔරු මික්ස් ඇෂෝල්ට් (පුද්) සමාගම**

රිට් ගොනු කර උසාවි අගය කිරීම් ද ලබාගෙන ඇත. 2023 දී රු. මිලියන 40 ක් ගෙවා ඇත.මාසික වාරික පදනමින් ආපසු ගෙවමින් පහසුකම නිරවුල් කිරීමට ණයගැණුම්කරු එකඟ වී ඇත.

***7.*** **වැවිලි සංවර්ධන සහ කළමණාකරන (පුද්) සමාගම**

ණයගැණුම්කරු සොයාගැනීමට නොහැකිවීම හේතුවෙන් දැනට නීතිමය ක්‍රියාමාර්ග අත්හිටුවා ඇත. ණයගැණුම්කරු සොයාගැනීමට වෙනත් විකල්ප අනුගමනය කෙරේ.

***8.*** **ආචාර්ය යූ.ජී. එෆ් ප්‍රනාන්දු**

නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර එය ඇසීමේ අවස්ථාවේ පවතී. ණය ගැණුම්කරු නීතීඥයින් හරහා නිරවුල් කිරීමේ සැලැස්මක් සඳහා කැපවී සිටින අතර ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව ඒ සඳහා කටයුතු කරමින් සිටී.

***9.*** **සීගිරිය වයිස්රෝයි හොටෙල්ස් (පුද්) සමාගම**

රිට් ලබාගෙන ඇත. දේපලෙහි වත්මන් පදිංචිකරු විසින් ගොනු කරන ලද අභියාචනය හේතුවෙන් රිට් ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇත.

නිරවුල් කිරීම සඳහා තවදුරටත් සාකච්ඡා කිරීමට ණයගැණුම්කරු එකඟ වී ඇත.කෙසේ වෙතත් අද වන තුරු නිරවුල් කිරීමකට පැමිණ නැත.

***10.*** **අනුර මැන් පවර් සප්ලයර්ස් (පුද්) සමාගම**
සමාගම විසින් ඈපකර අත් කරගෙන ඇත.දේපල වීකිණීමට ඇති අතර , දේපල බැහැර කිරීමෙන් පසුව හිඟ ශේෂය නිරවුල් කරනු ලැබේ.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| අංකය | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2006 අංක 4 දරන මූල්‍ය සමාගම් නියෝගය, 5 වගන්තිය (තනි ණයගැති සීමාව ) | 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූලික ප්‍රාග්ධනයෙන් සියයට 1 (රු. මිලියන 36.71) ඉක්මවා එම්බීඑස්එල් රක්ෂණ සමාගමට රු. මිලියන 55 ක අනාරක්ෂිත ණය සහ අත්තිකාරම් ලබා දීමෙන් සමාගම විසින් උපුටා දක්වන ලද නියෝගය උල්ලංඝනය කර ඇත. | අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. 2023 දී ශීර්ෂගත පහසුකම සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත. | උපුටා දක්වන ලද නියෝගයට අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ආ) | 2018 අංක 3 දරන මූල්‍ය ව්‍යාපාර පනත නියෝගය , 1 වගන්තිය (ප්‍රමාණවත් ප්‍රාග්ධන අවශ්‍යතාවය ) | උපුටා දක්වන ලද නියෝගයේ විශේෂයෙන් දක්වා ඇති අවම නියාමන මට්ටම ඉක්මවා ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය පවත්වා ගැනීමට සමාගම අපොහොසත් වී ඇත.<br>2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 12.01 ක් වන අතර එය අවම නියාමන අවශ්‍යතාවය වන සියයට 12.5 ට වඩා අඩුය. | අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. වර්තමානයේදී සමාගම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයේ අවශ්‍යතාවයට අනුකූල වේ. | උපුටා දක්වන ලද නියෝගයට අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ඇ) | කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත රීති අංක 7.14.2 | 2021 ඔක්තොම්බර් 1 දින 358,655,096 ක හිමිකම් කොටස් නිකුතුව හේතුවෙන් 2021 නොවැම්බර් 1 දින සිට බලපාන පරිදි සියයට 20 අවම මහජන හිමිකාරිත්වයේ අවශ්‍යතාවට අනුගත වීමට සමාගමට නොහැකි වීම. සමාගමේ නව හිමිකම් කොටස් නිකුතුව හේතුවෙන් මහජන කොටස් හිමිකාරීත්වය සියයට 15.50 ක් දක්වා පහළ ගොස් ඇත. | අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. 2023 අප්‍රේල් 26 සිට බලපැවැත්වෙන පරිදී සමාගමේ සුරැකුම්පත් කොළඹ කොටස් හුවමාරුවේ දිරි සවි මණ්ඩලය වෙත මාරුකිරීමත් සමග කාර්යය නිවැරදි කර ඇත. | උපුටා දක්වන ලද නියෝගයට අනුකූලවීම අවශ්‍ය වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 495.6 ක අලාභයක් වූ අතර පෙර වර්ෂයේ එයට අනුරූප ලාභය රු. මිලියන 529 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,024.6 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධානම හේතු වන්නේ පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශුද්ධ පොළී ආදායම රු. මිලියන 1,094.9 කින් අඩුවීම, වෙනත් මෙහෙයුම් ආදායම රු. මිලියන 142 කින් අඩුවීම සහ ණය සහ අනෙකුත් වත්කම් සඳහා හානිකරණ ගාස්තු රු. මිලියන 91 කින් වැඩිවීමයි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පෙර වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමග පහත දක්වා ඇත.

| විස්තරය | 2022 (රු. '000) | 2021 (රු.'000) | වෙනස (%) | විචලනයට හේතුව |
|---|---|---|---|---|
| පොළිය සහ සමාන ආදායම | 6,451,083 | 5,525,955 | 16.74 | ණය සහ ලැබිය යුතු මුදල් වැඩිවීම සහ වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය ආයෝජන වැඩිවීම පොළී ආදායම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| පොළිය සහ සමාන වියදම | 4,695,684 | 2,675,588 | 75.50 | තැන්පතු පදනම සහ සමාගමේ ණය ගැනීම් වැඩිවීම හේතුවෙන් පොළී වියදම වැඩිවී ඇත. |
| ගාස්තුව සහ කොමිස් ආදායම | 129,157 | 189,929 | 58.78 | ප්‍රධාන වශයෙන් වෙළෙඳාම හා වෙනත් ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල අඩුවීම හේතුවෙන් ගාස්තු හා කොමිස් ආදායම අඩුවී තිබුණි. |
| ශුද්ධ වෙළෙඳ ආදායම | 2,255 | 44,281 | 94.90 | ලාභයක් හෝ අලාභයක් සහිතව සාධාරණ වටිනාකමින් මූල්‍ය වත්කම් බැහැර කිරීමේ ආදායම අඩුවීම ශුද්ධ වෙළෙඳ ආදායම අඩුවීමට හේතු වී තිබුණි. |
| වෙනත් මෙහෙයුම් ආදායම | 92,229 | 234,335 | 60.64 | දේපල හා උපකරණ බැහැර කිරීම් ලාභය , ලාභාංශ ආදායම, නිශ්චල දේපල වලින් ලාභ සහ අලාභ සහ වෙනත් ආදායම් පහළ යාම වෙනත් මෙහෙයුම් ආදායමේ අඩුවීමට හේතු වී තිබුණි. |
| ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් | 16,504 | (74,450) | 122.2 | පුද්ගල සැලකිය යුතු ණය සඳහා වූ හානිකරණය සහ ලියා හැරීම් වැඩිවීම, ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද ආංශික අනුපාත වලට සාපේක්ෂව පහත දක්වා ඇත.

| විස්තරය | ආංශික අනුපාතය * | සමාගම 2022 | සමාගම 2021 |
|---|---|---|---|
| **කාර්යසාධන අනුපාත** | | | |
| හිමිකම් මත ප්‍රතිලාභ (ROE) | 7.37 | (12.60) | 18.77 |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | 2.56 | (1.51) | 1.59 |
| පොළී ආන්තිකය | 6.69 | 5.85 | 9.42 |
| **වත්කම් තත්ත්ව අනුපාතය** | | | |
| දළ අක්‍රීය අත්තිකාරම් (NPL) | 17.41 | 17.77 | 15.92 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 8.50%) | 20.56 | 11.33 | 10.75 |
| මුළු ප්‍රාග්ධනය (අවම 12.50%) | 21.99 | 12.01 | 11.33 |
| **ව්‍යවස්ථාපිත අනුපාතය** | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය | 10.68 | 13.41 | 12.92 |

*** ආංශික අනුපාත ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ මූල්‍ය අංශය - බලපත්‍රලාභී මූල්‍ය සමාගම් යටතේ උපුටා ගන්නා ලදී.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 වර්ෂය තුළදී දීර්ඝ කාලයක් පොදු ලෙජරයෙහි පවතින බැර ශේෂයන්ගේ එකතුව රු.7,815,340 ක් ආපසු ලිවීමට සහ දීර්ඝ කාලයක් පොදු ලෙජරයෙහි පවතින හර ශේෂයන්ගේ (ණය හා අත්තිකාරම් හැර) එකතුව රු.2,167,507 ක් ලියා හැරීමට අනුමත කර තිබුණි. | සමාගම විසින් සමාගමේ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් දීර්ඝ කාලීන හිඟ පොදු ලෙජර ශේෂයන් රු. 7,815,339.89 ක් ආපසු ලියා සහ රු. 2,167,506.99 ක් ලියා හැර තිබුණි. ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට පෙර ඉවත් කිරීමට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගෙන තිබුණි.<br><br>මණ්ඩලය අනුමත කරන ලද දිගුකාලීන හිඟ ශේෂයන් ඉවත් කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව දිගුකාලීන හිඟ හර හා බැර ශේෂ ආපසු ලිවීමට හා ලියාහැරීමට සමාගම සලකා බලයි. ඒ අනුව වර්ෂ 5 කට වැඩි දිගුකාලීන හිඟ ශේෂ ආපසු ලියා සහ | ලියා හැරීම හේතුවෙන් සමාගමට සිදුවිය හැකි පාඩුව අවම කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | | ලියාහරින ලදී. ලාභ සහ අලාභ ගිණුම වෙත වූ ශුද්ධ බලපෑම රු.5,647,832.90 ක ආදායමකි. | |
| (ආ) | සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී, ආපසු අයකර ගැනීමට නොහැකිවීම මත එකතුව රු.982,556,008 ක් වූ අක්‍රිය ණය සහ අත්තිකාරම් 8,493 ක් ලියා හැර තිබුණි. | කළඹෙහි වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින්,ලියාහැරීමේ ප්‍රතිපත්තිය අනුව ලියාහැරීමේ ක්‍රියාපටිපාටිය යොදාගන්නා ලදී. ලියාහැරීමට පෙර මෙම අක්‍රීය ණය අයකරගැනීමට ගත හැකි සියළු ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර අවසාන විකල්පය ලෙස මෙය ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, ලියාහරින ලද පහසුකම් අයකරගැනීම විශේෂ කණ්ඩායමකට පවරා ඇත. | ණය හා අත්තිකාරම් ලියා හැරීමට ප්‍රථම ආපසු අයකර ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම ගැනීමට නිර්දේශ කෙරේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් 2022 වර්ෂය තුළ අත්කරගත් වාහන 96 ක් අලෙවි කර තිබුණ අතර වාහන 43 ක විකුණුම් වටිනාකමෙන් හිඟ බඳු ශේෂය වන රු.61,565,170 ක් අයකරගත යුතුව තිබුණි. කෙසේ වෙතත් විකිණීමෙන් රු.44,113,139 ක් පමණක් ලැබී තිබුණ අතර ශේෂය වන රු. 17,452,030 ක් වාහන බැහැර කිරීමෙන් පසුවද තවමත් ණුණුදෙනුකරුවන්ගෙන් අයකරගත යුතුව තිබුණි. ඉහත සඳහන් මුදල ණුණුදෙනුකරුවන්ගෙන් අයකරගැනීමට නොහැකිවීම මත සමාගමට පාඩුවක් දැරීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. මෙම වාර්තාවේ *ඇමුණුම I* බලන්න. | වාහන අංගන මෙහෙයුම් ක්‍රියාපටිපාටියේ දක්වා ඇති පරාමිතීන් තුල සමාගම විසින් නැවත අත්කරගත් වාහන බැහැර කරන ලදී. පවතින කැළඹිලි සහිත කාලය තුල හැකි සෑම විටම වත්කම් පිළිබඳ අවබෝධ කර ගැනීම ආර්ථික තීරණයක් වන අතර, එවැනි බැහැර කිරීමේ තීරණයක් ගනු ලබන්නේ එම හිඟය අයකරගැනීමේ ක්‍රියාවලිය හරහා ණුණුදෙනුකරුවන්ගෙන් අයකරගැනීමට අපේක්ෂා කරන බව උපකල්පනය කරන බැවිනි. | අත්කරගත් වාහන විකිණීමෙන් සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි කටයුතු කළ යුතු බව නිර්දේශ කෙරේ. |
| (ආ) | අත්කරගත් වාහන අංගනයෙන් බැහැර කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. අංගනයෙහි නවතා තිබූ වාහන 156 කින් වාහන 90 ක් දීර්ඝ කාලයක සිට එහි රඳවා තිබුණි. එය වසර ගණනාවක් පුරා අධික නඩත්තු පිරිවැයක් දැරීමටත්, වාහනවල වෙළඳපල වටිනාකම අඩුවීමෙන් පාඩු සිදුවීමටත් හේතුවිය හැක.විස්තර පහත දැක්වේ. | වාහන 90 අතරින් වාහන 54 ක් උසාවි බැඳුණු වාහන වන අතර බැඳුම්කරය උසාවියෙන් නිදහස් වන තුරු ඒවා බැහැර කළ නොහැක.පාරිභෝගිකයන්ගෙන් සිදුවන සක්‍රිය ආර්එම්වී විරෝධතා හේතුවෙන් වාහන 05 ක් බැහැර කළ නොහැක. විරෝධතා අවලංගු කිරීමෙන් පසුව එම වාහන බැහැර කරනු ලබන අතර ලැයිස්තුවේ ඇති වාහන 11 පසුව බැහැර කර සහ/හෝ මුදාහැර ඇත. කෙසේ වෙතත්, වාහනවල පවතින තත්වය හේතුවෙන් ආයතනයට විශාල පාඩුවක් සිදු නොවී බැහැර නොකල වාහන 20 ක් ඇති අතර එම වාහන බැහැර කිරීමේ තීරණයේ නිර්ණායක සපුරන්නේ නැත. | බැඳුම්කර උසාවියෙන් නිදහස් කරගැනීමට සියළු උත්සාහයන් දැරිය යුතු අතර සමාගමට අවම පාඩුවක් වන පරිදි අත්කරගත් වාහන බැහැර කිරීම නිර්දේශ කෙරේ. |

| **විස්තරය** | **වාහන සංඛ්‍යාව** |
|---|---|
| වර්ෂ 1-3 | 13 |
| වර්ෂ 3-5 | 32 |
| වර්ෂ 5 ට වැඩි | 45 |
| **එකතුව** | **90** |

විකල්ප විසඳුමක් ලෙස දිගුකල් පවතින වාහන වෙන්දේසි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගනු ඇත.

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂය තුල සමාගම විසින් නැවත අත්කරගත් වාහන 96 ක් අලෙවි කර තිබුණි. කෙසේ වෙතත්, එම වාහන 96 අතරින් වාහන 67 ක් තක්සේරු වාර්තාවේ සඳහන් බල කරනලද විකුණුම් වටිනාකමට වඩා අඩු මිලකට අලෙවි කර තිබුණි. මෙම ගණුදෙනුවෙන් සමාගමට සිදුවූ සමස්ත පාඩුව රු.17,818,600 කි. | වාහන මෙහෙයුම් ක්‍රියාපරිපාටියේ නිර්ණායක තුල වාහන බැහැර කිරීම සිදු කරනු ලැබේ. මෙම විධිවිධාන යටතේ වාහනවල බල කරනලද විකුණුම් වටිනාකමට වඩා අඩු ඉදිරිපත් කිරීමක් ලැබුණු තත්වයක් තුල බැහැර කිරීමේ කමිටුව බැහැර කිරීමේ තීරණයකට පැමිණේ.<br><br>සමාලෝචිත කාලසීමාව ඇතුලත වාහනවල අගය දැඩිලෙස පිරිහුණු අතර විශේෂයෙන් ඉන්පසුව ඇතිවූ දේශපාලන අස්ථාවරත්වය හා ආර්ථික අර්බුදය නිසා වාහන බල කරනලද විකුණුම් වටිනාකමට බැහැර කිරීම සිදුකළ නොහැකි විය.කෙසේ වෙතත්, බල කරනලද විකුණුම් වටිනාකමට සියයට 20 කට වඩා අඩුවෙන් වාහන බැහැර කළද , සියළුම වාහන ගණුදෙනු ලාභ මත බැහැර කිරීමට සමාගමට හැකිවිය. ප්‍රතිපත්තියක් වශයෙන් බල කරනලද විකුණුම් වටිනාකමට සියයට 80 කට වඩා ඉහලින් වාහන බැහැර කිරීමට බැහැර කිරීමේ කමිටුව තීරණය කර තිබුණි. | සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ. |
| (ඈ) | සමාගම විසින් 2022 වර්ෂය තුල මාරවිල දේපල වෙළඳාම් ව්‍යාපෘතියෙන් කැබලි 07 ක් ද මඩම්පැල්ල දේපල වෙළඳාම් ව්‍යාපෘතියෙන් කැබලි 19 ක් ද අලෙවි කර තිබුණි. කෙසේ වෙතත්, මාරවිල හා මඩම්පැල්ල යන එක් එක් ව්‍යාපෘතියේ කැබලි 03 බැගින් තක්සේරු වාර්තාවේ සඳහන් බල කරනලද විකුණුම් වටිනාකම හා වෙළඳපල වටිනාකමට වඩා අඩු මිලට විකුණා තිබුණි. එසේම මඩම්පැල්ල ව්‍යාපෘතියේ කැබලි 19 න් කැබලි 03 ක් තක්සේරු වාර්තාවේ සඳහන් බල කරනලද විකුණුම් වටිනාකම හා වෙළඳපල වටිනාකමට වඩා අඩු මිලට විකුණා තිබුණි. සමස්ත | **මාරවිල හා මඩම්පැල්ල**<br><br>අප විසින් මාරවිල හා මඩම්පැල්ල සඳහා පිළිවෙලින් 2020 සැප්තැම්බර් 09 හා ඔක්තෝබර් 02 දින තක්සේරු වාර්තා ලබාගෙන තිබුණි.2020 මාර්තු සිට 2021 නොවැම්බර් දක්වා රටේ පැවති කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් මාරවිල හා මඩම්පැල්ල කැබලි සඳහා දුර්වල ඉල්ලුමක් පැවතුණි. ඊට අමතරව, කැබලිවල අමුතු හැඩයක් හා එක් කැබැල්ලක පැවති පටු මාර්ග ප්‍රවේශය නිසා මඩම්පැල්ල කැබලි සඳහා දුර්වල ඉල්ලුමක් පැවතුණි. එම නිසා ව්‍යාපෘති දෙකෙහිම කැබලි සාධාරණ මිලකට බැහැර කිරීමට අපට සිදුවිය. එසේ වුවත්, අප විසින් තක්සේරු වාර්තාවේ දක්වන ලද වෙළඳපල අගය හා බල කරනලද | සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | බලපෑම රු.1,768,500 ලෙස ගණනය කෙරේ. (විකුණුම් වටිනාකම හා බල කරනලද විකුණුම් වටිනාකම අතර වෙනස) | විකුණුම් වටිනාකමට වඩා අඩු මිලකට කැබලි විකුණුවද මණ්ඩලය අනුමත සාමාන්‍ය පර්වසයක මිලට වඩා වැඩි මිලකට අපි මෙම කැබලි විකුණා ඇත. | |
| (ඉ) | සමාගම විසින් 2018 සිට 2021 දක්වා කිහිප වතාවකදී විශේෂිත ගණුදෙනුකරුවෙකුට කෙටි කාලීන ණය, කාලීන ණය සහ ණය සහන ණය පහසුකම් ප්‍රදානය කර තිබුණි.2021 වර්ෂයේදී එම ගණුදෙනුකරුගේ අවිධිමත් ගෙවීම් රටාව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සහන වැඩසටහන අනුව, සමාගම විසින් ඉහත සියළු ණය රු. 38,644,244 ක එක් ණය මුදලකට හරවා පහසුකම ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රතිව්‍යුහගත පහසුකම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>• ණය පටිපාටි අත්පොත අනුව ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලියට ප්‍රවේශවීමට පෙර සමාගම විසින් ණය ගැණුම්කරුගේ ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ ඇගයීමක් සිදුකොට නොතිබුණි.<br>• ණය ගැණුම්කරුගේ අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ ඉතිහාසය පිළිබඳ සලකා බලා නොතිබුණි.සීබීයු/2021/606/016 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව, පසු ණය මෙහෙයුම් අංශය විසින් ව්‍යාපාර කාර්යසාධනය පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදුකර ණය කමිටුව වෙත වාර්තා කර නොතිබුණි.<br>• ඇපකරුගේ මාසික ආදායම සාධාරණීකරණය කිරීමට අවශ්‍ය විශ්වාසනීය සාක්ෂි ලේඛන ලබාගෙන නොතිබුණි.<br>• සමාගමට ඇපකරු වෙත | ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශිත සහන පැකේජ යටතේ ශීර්ෂගත පහසුකම ප්‍රතිව්‍යුහගත කර ඇත.වසංගත තත්වය හා අයහපත් ආර්ථික තත්වය සේවාදායකයාට දැඩි ලෙස බලපා තිබුණි.තාවකාලික සහන පැකේජය යටතේ පහසුකම නැවත උපලේඛණගත කර ඇති බැවින් අපගේ සාමාන්‍ය ණය ඇගයීම අත්හැරීමට අපට සිදුවිය.<br>මුදල් අයකරගැනීම සඳහා අනෙක් විකල්පය නීතිමය කටයුතු ආරම්භ කිරීම නිසා පවතින ලේඛන යොදාගනිමින් ප්‍රතිව්‍යුහගත කිරිම සිදු කරන ලද අතර, රටේ පැවති තත්වය හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 අංක 05 දරන චක්‍රලේඛයේ අංක 4 (iii) වගන්තියේ උපදෙස් පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම තාවකාලිකව නවතා දමන ලදී.<br>ආපසු ගෙවීම ආරම්භ කිරීමට මාස 03 ක මූලික සහන කාලයක් සහිතව 2021 දෙසැම්බර් මාසයේදී ශීර්ෂගත ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකම ප්‍රදානය කර තිබුණි.කෙසේ වෙතත් පොරොන්දු වූ පරිදි සේවාදායකයා විසින් පළමු කුලී වාරිකයේ සිට හිඟ කුලී වාරික ලබාදීම සිදුකළේ නැත.<br>2022 පෙබරවාරි මාසයේ සිට අප විසින් සේවාදායකයා සන්නිවේදනය කිරීමට හැකි සෑම උත්සාහයක් ගනු ලැබුවද ඔහු විසින් ඒවා සඳහා ප්‍රතිචාර දැක්වූයේ නැත. එම නිසා ණය මුදල් ආපසු අයකරගැනීමට ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට වඩා වැඩිදුර සමාලෝචනයක් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව අපගේ අදහස වූ අතර ඒ අනුව මෙම පහසුකම 2022 ජූලි 05 දිනෙන් අවසන් කර ලිපිගොනුව නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුවට මාරු කරන ලදී.<br>නීති දෙපාර්තමේන්තුව විසින් යවන ලද ඉල්ලීම් ලිපියට ධනාත්මක ප්‍රතිචාර නොලැබීම හේතුවෙන් එම සේවාදායකයාට එරෙහිව 2023 ජනවාරි 16 දින හෝ ඊට ආසන්න දිනයකදී කොළඹ වාණිජ | සමාගම විසින් මුළු හිඟ මුදල ගණුදෙනුකරුගෙන් හෝ ඇපකරුගෙන් අය කර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතු බවට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | ලබාවීමට නොහැකිවීම නිසා ඇපකරුට එරෙහිව වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මහාධිකරණයේ අංක එච්සී/සිවිල්/ 7/2023 දරන නඩුව ගොනු කර ඇති අතර නඩුව ක්‍රියාත්මක වෙමින් පවතී. | |

**3.3 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත සහ උපකරණ**

| අංක | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණය ගැණුම්කරුවන් විසින් ණය මුදල් වලට එරෙහිව උකසට තබන ලද දේපල, පහසුකම අක්‍රිය තත්වයට පත්වීම හේතුවෙන් සමාගම විසින් අත්පත් කරගෙන තිබුණ අතර එවා මුල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කර තිබුණි. සමාගම විසින් අත්පත් කරගෙන තිබුණ දේපල 05 ක් ආයෝජන දේපල ලෙස පෙන්වා තිබුණද පෙර ඉඩම් හිමියන් සමඟ පවතින නීතිමය තත්ත්වයන් හේතුවෙන් සන්තකයේ තබාගැනීම සීමා කර ඇත. උකසට තබන අවස්ථාවේදී දේපලවල නීතිමය හිමිකම පිළිබඳ සමාගම සැලකිල්ලක් දක්වා නොතිබුණි. | අත්පත් කරගැනීමේදී සියළුම දේපල ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කරන ලදී.<br><br>මෙම වත්කම් ආයෝජන දේපල ලෙස හඳුනාගන්නා අවස්ථාවේදී සමාගමට දේපල සඳහා පැහැදිලි හිමිකමක් ඇති අතර නීතිමය නඩු කිසිවක් නොවීය.මෙම දේපල සඳහා නීතිමය හිමිකම ලබාගැනීමෙන් පසු නීතිමය නඩු ආරම්භ විය. එබැවින් එය වත්කම් හඳුනාගැනීමේ නිර්නායකයට අනුකූල වේ.<br><br>මීට අමතරව එහි වර්තමාන තත්වය සැලකිල්ලට ගනිමින් මුල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 6.05 ක ප්‍රතිපාදනයක් සිදු කර ඇත. | නීතිමය අවසරය ලබා ගැනීමෙන් පසු ආයෝජන දේපල ඵලදායී ආකාරයෙන් භාවිතා කිරීම හා ණය ලබාදීමේදී උකසට තබන ලද දේපලවල නීතිමය වටපිටාව පිළිබඳ සහතික විය යුතු බවට නිර්දේශ කෙරේ. |
| (ආ) | අත්පත් කරගත් දින සිට ආයෝජන දේපල වලින් කිසිදු ආදායමක් ජනිත නොවුවත්, 2023 අප්‍රේල් 30 විගණන දිනය දක්වා සමාගම විසින් දරන ලද නීති ගාස්තු හා ක්ෂය ප්‍රමාණය රු.මිලියන 40.8 ක් හා රු. මිලියන 9.5 ක් වේ. මෙම ඉඩම් සහ ගොඩනැගිලි තවමත් කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව නිශ්කාර්යව පවතී. | පවතින නඩු කටයුතු හේතුවෙන් පසුගිය මුල්‍ය වර්ෂය ඇතුලත මෙම ආයෝජන දේපල සංවර්ධනය කිරීමට, ආදායම් උත්පාදනය කිරීමට හෝ බැහැර කිරීමට ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවට නොහැකි විය.මෙම සියළු දේපල ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව සතුව ඇති අතර, කෙසේ වෙතත් පෙර ඉඩම් හිමියන් සමග පවතින නඩු කටයුතු නිසා ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවට දේපල භෞතික සන්තකයේ තබාගැනීමට නොහැකි වී ඇත.එබැවින් ගොඩනැගිලි සඳහා නීති ගාස්තු හා ක්ෂයවීම් එසේම සිදු කර ඇත. | නීති ගාස්තු අඩු කරගැනීම සඳහා ණය ලබාදීම ආරම්භයේදී උකසට තබන ලද දේපලවල නීතිමය අවසරය පිළිබඳ සැහීමකට පත් විය යුතු අතර සහ මෙම දේපල හරහා ලාභයක් උත්පාදනය කරගැනීමට කටයුතු සිදුකළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| අංක | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව 1,274 ක් වූ අතර එදිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 896 ක් විය. 2022 දෙසැම්බර් 31 වන විට රැකියා කාණ්ඩ 14 ක තනතුරු 504 ක සංඛ්‍යාවක් පුරප්පාඩු වී ඇති අතර, රැකියා කාණ්ඩ 2 ක අතිරික්ත සේවකයින් 126 ක සංඛ්‍යාවක් පවතින බව නිරීක්ෂණය විය. එබැවින් 2022 දෙසැම්බර් 31 දිනට 378 ක සේවක සංඛ්‍යාවක් පුරප්පාඩුව පවතින අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 29.6 ක් නියෝජනය කරයි. විස්තර පහත වගුවෙහි දැක්වේ. | ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තුවල පවතින ව්‍යුහය සමාලෝචනය කරමින් පවතින අතර මෙම වසර අවසානය වන විට අවසන් කිරීමට නියමිතය. කෙසේ වෙතත්,පරාසය සහ ශාඛා ව්‍යුහය දැනටමත් අවසන් කර ඇත. | සමාගමේ ක්‍රියාකාරකම් සුමටව සිදුකිරීම සහතික කිරීමට පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම නිර්දේශ කෙරේ. |

| | **සේවක සංඛ්‍යාව** | **ප්‍රතිශතය %** |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව | 1,274 | - |
| තථ්‍ය සේවක සංඛ්‍යාව | 896 | - |
| තනතුරු 14- හිඟ (අ) | 504 | 39.5 |
| තනතුරු 02-අතිරික්ත (ආ) | (126) | 9.8 |
| පුරප්පාඩු කාර්ය මණ්ඩල සංඛ්‍යාව(අ-ආ) | 378 | 29.6 |

| අංක | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂය තුල සේවකයින් 148 ක් සමාගමෙන් ඉවත්ව ගොස් ඇති අතර එය 2022 දෙසැම්බර් 31 දිනට පවතින සාමාන්‍ය සේවක සංඛ්‍යාවෙන් සියයට 15.8 ක් නියෝජනය කරයි. එය සමාලෝචිත වර්ෂය තුල සමාගමේ ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුමක් පෙන්නුම් කරයි. | අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී.<br><br>කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කර ඇත.මෙය වර්තමාන ආර්ථිකය පසුබෑමේ පොදු සාධකයකි. | සමාගමේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩල පිරිවැටුම අවම කිරීමට නිර්දේශ කෙරේ. |
| (ඇ) | 2022 මුදල් වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු නවයක් (9) නිරීක්ෂණය විය. එම පුරප්පාඩු පිරවීම සඳහා අදාළ බලධාරීන් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දක්වා ඇත. | මෙම කාරණය දැනටමත් විසඳා ඇත. | ප්‍රමුඛතා පදනමින් පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගැනීම නිර්දේශ කෙරේ. |

| **තනතුර** | **අනුමත සේවක සංඛ්‍යාව** | **2022/12/31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු** |
|---|---|---|---|
| සහකාර සාමාන්‍යාධිකාරී | 1 | 1 | - |
| ප්‍රධාන කළමනාකරු/ | 1 | - | 1 |

| | | | |
|---|---|---|---|
| ප්‍රාදේශීය කළමනාකරු | | | |
| ජ්‍යෝෂ්ඨ කළමනාකරු | 2 | 2 | - |
| සහකාර කළමනාකරු | 1 | - | 1 |
| විධායක නිලධාරී | 4 | 4 | - |
| කනිෂ්ඨ විධායක නිලධාරි | 3 | 1 | 2 |
| මාණ්ඩලික සහකාර | 8 | 3 | 5 |
| **එකතුව** | **20** | **11** | **9** |

ඇමුණුම *I*

| අංකය | වාහන අංකය | ඉවත්කල දිනය | මුළු මුදාහැරීම (අ) රු. | මුළු අයකර ගැනීම් (ආ) රු. | වාහනය බැහැර කිරීමෙන් පසු අයකර ගත යුතු මුළු හිඟය (අ-ආ) රු. |
|---|---|---|---|---|---|
| 1 | WP FZ-0186 | 29/07/2022 | 2,997,680.00 | 1,442,737.40 | 1,554,942.60 |
| 2 | SP ND-2687 | 14/03/2022 | 5,800,000.00 | 4,692,888.37 | 1,107,111.63 |
| 3 | WP LY-1812 | 28/03/2022 | 3,325,000.00 | 2,509,135.75 | 815,864.25 |
| 4 | NC RF-2869 | 28/03/2022 | 1,575,000.00 | 766,459.16 | 808,540.84 |
| 5 | 48-0145 | 21/02/2022 | 840,000.00 | 39,451.14 | 800,548.86 |
| 6 | NW HW-6738 | 14/12/2022 | 1,280,000.00 | 499,863.13 | 780,136.87 |
| 7 | NC RF-4213 | 19/12/2022 | 900,000.00 | 121,150.00 | 778,850.00 |
| 8 | 48-0985 | 24/02/2022 | 800,000.00 | 38,922.67 | 761,077.33 |
| 9 | WP NF-5335 | 23/03/2022 | 7,000,000.00 | 6,265,304.86 | 734,695.14 |
| 10 | NW HO-7160 | 27/07/2022 | 1,150,000.00 | 447,442.22 | 702,557.78 |
| 11 | NW NA-9082 | 29/07/2022 | 1,700,000.00 | 1,050,609.60 | 649,390.40 |
| 12 | NC RF-6010 | 23/03/2022 | 1,295,000.00 | 669,344.88 | 625,655.12 |
| 13 | NW NA-1690 | 21/02/2022 | 1,540,000.00 | 918,106.40 | 621,893.60 |
| 14 | NC RF-3856 | 10/08/2022 | 1,100,000.00 | 527,086.24 | 572,913.76 |
| 15 | 63-4268 | 28/07/2022 | 1,350,000.00 | 802,695.79 | 547,304.21 |
| 16 | WP LO-1544 | 02/08/2022 | 4,600,000.00 | 4,122,096.81 | 477,903.19 |
| 17 | 62-9993 | 21/02/2022 | 1,850,000.00 | 1,384,591.78 | 465,408.22 |
| 18 | NW ND-5330 | 31/01/2022 | 1,800,000.00 | 1,354,115.58 | 445,884.42 |
| 19 | SP GD-7693 | 26/01/2022 | 1,263,000.00 | 843,855.74 | 419,144.26 |
| 20 | CP NB-2357 | 24/02/2022 | 1,500,000.00 | 1,105,591.15 | 394,408.85 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21 | SP ND-3552 | 24/02/2022 | 5,600,000.00 | 5,208,395.44 | 391,604.56 |
| 22 | 48-9828 | 22/02/2022 | 625,000.00 | 286,563.41 | 338,436.59 |
| 23 | 48-0964 | 25/02/2022 | 725,000.00 | 426,700.53 | 298,299.47 |
| 24 | SP GH-0844 | 24/01/2022 | 1,025,000.00 | 762,814.96 | 262,185.04 |
| 25 | UP NA-3957 | 23/02/2022 | 1,100,000.00 | 841,902.32 | 258,097.68 |
| 26 | UP QL-8331 | 31/01/2022 | 528,000.00 | 272,927.94 | 255,072.06 |
| 27 | CP SO-7090 | 24/02/2022 | 235,000.00 | 35,962.85 | 199,037.15 |
| 28 | 62-5118 | 26/07/2022 | 700,000.00 | 517,321.06 | 182,678.94 |
| 29 | NW BHA-5280 | 25/01/2022 | 209,930.00 | 50,784.22 | 159,145.78 |
| 30 | CP YG-2159 | 25/02/2022 | 280,000.00 | 128,339.16 | 151,660.84 |
| 31 | SP BEL-1982 | 25/01/2022 | 484,000.00 | 336,206.17 | 147,793.83 |
| 32 | WP GN-7046 | 31/10/2022 | 328,000.00 | 199,753.17 | 128,246.83 |
| 33 | CP BGY-6290 | 27/05/2022 | 181,930.00 | 57,467.18 | 124,462.82 |
| 34 | NW BHL-1330 | 22/03/2022 | 138,530.00 | 20,784.13 | 117,745.87 |
| 35 | SP AAA-3347 | 25/01/2022 | 245,000.00 | 147,909.66 | 97,090.34 |
| 36 | WP YM-6018 | 26/01/2022 | 330,000.00 | 249,672.47 | 80,327.53 |
| 37 | WP YK-9314 | 23/02/2022 | 330,000.00 | 269,180.88 | 60,819.12 |
| 38 | WP YT-6120 | 23/02/2022 | 280,000.00 | 219,279.15 | 60,720.85 |
| 39 | NP LJ-6670 | 31/05/2022 | 830,000.00 | 791,992.06 | 38,007.94 |
| 40 | EP BEK-5654 | 25/01/2022 | 164,100.00 | 135,413.91 | 28,686.09 |
| 41 | WP JW-5909 | 05/07/2022 | 1,540,000.00 | 1,535,715.35 | 4,284.65 |
| 42 | NW DAB-0377 | 25/05/2022 | 770,000.00 | 768,236.51 | 1,763.49 |
| 43 | NW GL-7931 | 22/12/2022 | 1,250,000.00 | 1,248,367.94 | 1,632.06 |
| එකතුව | | | **61,565,170.00** | **44,113,139.14** | **17,452,030.86** |